දරුවා! මම ඔබට වදන් කිහිපයක් උගන්වමි: අල්ලාහ්ගේ මග පෙන්වීම රැක ගනිමින් කටයුතු කරන්න. එවිට අල්ලාහ් ඔබ ආරක්ෂා කරයි; අල්ලාහ් (ඔබ කෙරෙහි පනවා ඇති වගකීම්) ආරක්ෂා කරන්න, එවිට ඔබ අල්ලාව ඔබේ පැත්තෙන් දැක ගනු ඇත; ඔබ අයද සිටින්නේ නම්, අල්ලාහ්ගෙන් අයද සිටින්න; ඔබ උදව් සොයන්නේ නම්, අල්ලාහ්ගෙන් උපකාරය පතන්න;

අබුල් අබ්බාස් අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. දිනක් මම අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පසුපසට වී සිටයෙමි. එවිට එතුමාණෝ මෙසේ ප්රකාශ කළහ: "දරුවා! මම ඔබට වදන් කිහිපයක් උගන්වමි: අල්ලාහ්ගේ මග පෙන්වීම රැක ගනිමින් කටයුතු කරන්න. එවිට අල්ලාහ් ඔබ ආරක්ෂා කරයි; අල්ලාහ් (ඔබ කෙරෙහි පනවා ඇති වගකීම්) ආරක්ෂා කරන්න, එවිට ඔබ අල්ලාව ඔබේ පැත්තෙන් දැක ගනු ඇත; ඔබ අයද සිටින්නේ නම්, අල්ලාහ්ගෙන් අයද සිටින්න; ඔබ උදව් සොයන්නේ නම්, අල්ලාහ්ගෙන් උපකාරය පතන්න; (ලොව සිටින) සියලු දනන් එකතු වි ඔබට හානියක් සිදු කිරීමට තැත් කළ ද, අල්ලාහ් ඔබට නිර්ණය කළ දෑ හැරෙන්නට ඔවුන් සියලු දෙනාට ඔබට කිසිදු හානියක් සිදු කිරීමට නොහැක. පන්සිද ඔසවනු ලැබීය, කඩදාසි වියැළින' තිර්මිදි තුමා කළ ප්රකාශය හැර වෙනත් වාර්තාවක, "ඔබ අල්ලාහ්ව (හදවතේ) ආරක්ෂා කරගන්න. ඔබ ඉදිරියේ ඔබ ඔහුව දකිනු ඇත. සතුටු දායක අවස්ථාවන්හි අල්ලාහ්ව හඳුනා ගන්න. දුෂ්කර අවස්ථාවන්හි ඔහු ඔබව හඳුනා ගනියි. දැනගන්න. ඔබට යමක් මග හැරුණේ නම් එය ඔබට ලැබෙන්නට තිබූ දෙයක් නොවීය. එමෙන්ම
ඔබට යමක් ලැබුණේ නම් එය ඔබට මග හැරෙන්නට තිබූ දෙයක් නොවීය. දැනගන්න. සැබැවින්ම
උපකාරය ඉවසීම සමග ය. සහනය දුක සමග ය. දුෂ්කරතාව පහසු ව සමගය." යැයි සඳහන් වේ.
[صحيح] [رواه الترمذي وغيره]

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා කුඩා අවදියේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග එතුමාණන්ගේ පසුපසින් වාඩි වී (ගමන් යමින්) සිටියේය. එවිට එතුමාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ඔහුට: "අල්ලාහ් ඔබට ප්රයෝජනය ලබා දෙන කරුණු හා විෂයයන් කිහිපයක් මම උගන්වමි" යැයි පවසා සිටියහ. ඔබ අල්ලාහ්ගේ නියෝග පිළිපදිමින් හා ඔහු තහනම් කළ දැයින් වැළකෙමින් ඔහුගේ කරුණ ආරක්ෂා කරන්න. එය පාපකම් හා පිටුපෑම් තුළ නොව, අවනතවීම් හා සමීපවීම් තුළින් ඔබ ලැබිය යුතු ය. ඔබ එසේ කළේ නම් ඔබේ ප්රතිඵලය වනුයේ මෙලොව හා මතුලොව පිළිකුල් සහගත දැයින් අල්ලාහ් ඔබ ව ආරක්ෂා කර ඔබ කොතැනක සිටියත් ඔබගේ වැදගත් කටයුතුවල දී ඔහු ඔබට උපකාර කරනු ඇත. ඔබ යමක් ඉල්ලන්නට අපේක්ෂා කළ විට, අල්ලාහ්ගෙන් හැර වෙනත් කිසිවකුගෙන් නො ඉල්ලන්න. සැබැවින්ම ඉල්ලා සිටින්නන් හට පිළිතුරු සපයන්නා ඔහු පමණය. ඔබ උදව් පතන්නට අපේක්ෂා කළ විට, අල්ලාහ් වෙතින් මිස වෙනත් කිසිවකුගෙන් උදව් නො පතන්න. සැබැවින්ම මහපොළොවේ වෙසෙන මුළු සමූහයාම ඔබට යම් සෙතක් කිරීමට එක්රැස් වුව ද අල්ලාහ් ඔබට එය නියම කර ඇති දෙයක් නම් මිස ඔවුන් විසින් ඔබට සෙත සලසන්නට නුපුළුවන, එමෙන්ම මහපොළොවේ වෙසෙන මුළු සමූහයාම ඔබට යම් හානියක් කිරීමට ඔවුන් එක්රැස් වුව ද අල්ලාහ් ඔබට එය නියම කර ඇති දෙයක් නම් මිස ඔවුන් විසින් ඔබට හානි කරන්නට නුපුළුවන යන වග ඔබ තුළ ස්ථීර කර ගත යුතු ය. එමෙන්ම මෙම කාරණය සර්ව බලධාරී අල්ලාහ් විසින්

නියම කරන ලද අතර, ඔහුගේ ප්රඥාව හා දැනුමට අවශ්ය දේ අනුව නියම කරන ලද වගත්, අල්ලාහ් නියම කර ඇති දෑහි කිසිදු වෙනසක් නොමැති වගත් ඔබ තුළ ස්ථීර කර ගත යුතුය. කවරෙකු අල්ලාහ්ගේ නියෝග ආරක්ෂා කරමින් හා ඔහු තහනම් කළ දැයින් වැළකී සිටිමින් අල්ලාහ්ව ආරක්ෂා කළේ ද, සැබැවින්ම අල්ලාහ් කවුදැයි ගැත්තා ඉදිරියෙන් ඔහු පෙන්වා දෙනු ඇත. එමෙන්ම ගැත්තාට උපකාර කර සහය දක්වනු ඇත. සැබැවින්ම මිනිසා සතුටුදායක අවස්ථාවන්හි අල්ලාහ්ට අවනත වූ විට, දුෂ්කර අවස්ථාවන්හි අල්ලාහ් ඔහුට නිදහස හා මිදීම ලබා දෙනු ඇත. සෑම ගැත්තෙකුම අල්ලාහ් ඔහුට නියම කර ඇති යහපත හා අයහපත පිළිගත යුතු ය. දුෂ්කරතත්වය කාර් ය බහුලත්වය සමග ගැත්තා ඉවසීම ප්රගුණ කළ යුතුය. මක්නිසාදයත් මිදීමේ හා නිදහස ලැබීමේ යතුර ඉවසීම වන බැවිනි. සැබැවින්ම ව්යසනය වනාහි එය දරුණු වූ විට මිදීම අල්ලාහ්ගෙන් පමණක් පැමිණෙන බැවිනි. සැබැවින්ම දුෂ්කරතාවක් ඇති වූ විටෙක අල්ලාහ් ඔහුට ප්රතිඵල වශයෙන් පහුසව පිරිනමනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/66522